

# පරිසරය සුරැකීමට කැප වූ කෝටිපති මාධ්‍ය ව්‍යාපාරිකයා

සී.පී. කුරුප්පු

**ඇ මරිකාව , බ්‍රිතාන්‍ය, ඕස්ට්‍රේලියාව, ඉන්දියාව සහ චිනය යන රටවල පැතිර ඇති දැවැන්ත මාධ්‍ය ජාලයක අධිපති කෝටිපති මාධ්‍ය ව්‍යාපාරික රූපට් මර්ඩොක් තම රූපවාහිනි පුවත්පත් සහ චිත්‍රපට හරහා ගෝලීය පරිසරය සුරැකීමේ ව්‍යාපාරයට අත දීමත් සමඟ එම මහඟු ව්‍යාපාරයට ලොකු ජන ප්‍රසාදයක් හිමි වෙමින් පවතියි.**

ලන්ඩන් නුවර මර්ඩොක් සතු ද සන් ටැබ්ලොයිඩ් (කුඩා ප්‍රමාණය) පුවත්පත එහි තුන් වැනි පිටුවේ උඩුකය නග්න තරුණියන්ගේ ඡායාරූප පළ කිරීමෙන් කලකට ඉහත දී ආන්දෝලනයක් ඇති කළ අතර කිලි තේසල් නමැති කතකගේ කොළ පැහැ ගැන්වූ නග්න රුවක් පළ කිරීම නිසා පුවත්පත සෑහෙන විවේචනවලට මුහුණ දුන්නේය. එහෙත් එම කොළ පැහැ රුව පළ කිරීමෙන් මර්ඩොක්ගේ පරිසරය සුරැකීමේ ව්‍යාපාරය ඇරඹිණි.

'ද ටයිම්ස් ද සන්ඩේ ටයිම්ස් ' ද සන් සහ නිවුස් ඔෆ් ද වර්ල්ඩ් ' පුවත්පත් පළ කරන බ්‍රිතාන්‍යයේ නිව්ස් ඉන්ටර්නැෂනල් ආයතනය සහ බීස්කයිබී රූපවාහිනී සේවයේත් එහි මව් සමාගම වන ඇමරිකාවේ නිවුස් කෝපරේෂන්හිත් අයිතිකරු රූපට් මර්ඩොක්ය.ඕස්ට්‍රේලියාවෙ උපන් ඔහු 1950 මුල් භාගයේ දී ලන්ඩන් නුවර "ඩේලි එක්ස්ප්‍රස්" පුවත්පතේ උප කතුවරයකු ලෙස සේවය කරමින් පුවත්පත් කලා දැනුම් දියුණු කර ගත්තේ ය. ඔහුට තම පියාවූ කීත් ගෙන් ඕස්ට්‍රේලියාවේ සහ නවසීලන්තයේ පැරැණි පුවත්පත් මිලදී ගනිමින් සහ අලුත් පුවත්පත් අරඹමින් මාධ්‍ය මාවතේ ඉදිරියට ගිය මර්ඩොක් රූපවාහිනී ආයතන හිමිකරුවකු ද විය. දැනට 75 හැවිරිදි වියේ පසුවන මර්ඩොක් නිවුස් කෝපරේෂන් ආයතනයේ ප්‍රධානයා ලෙස ඇමරිකාවේ මාධ්‍ය සහ පොත් ප්‍රකාශන සමාගම් කිහිපයකත් බ්‍රිතාන්‍යය සහ ආසියාවේ මාධ්‍ය ආයතන ගණනාවකත් චිත්‍රපට සහ ගීත තැටි නිෂ්පාදන සමාගම් කිහිපයකත් හිමිකරුය . ඔහු ගේ වත්කම ඩොලර් කෝටි 700 ට වැඩිය.

බ්‍රිතාන්‍යයේ මර්ඩොක්ගේ බී ස්කයි බී රූපවාහිනි ආයතනයෙන් නව සේවා ලබා ගැනීමේ උපකරණ සැපයීමේ දී බල ශක්තිය ඉතිරි කරන බල්බ තුනක් සහ අඩුවෙන් ජලය ගලා එන දිය නෑමේ උපකරණයක් පාරිභෝගිකයන්ට තෑගි දීමට එම රූපවාහිනි සේවය ක්‍රියා කරයි. ඇමරිකාවේ ෆොක්ස් රූපවාහිනි සේවය තම වැඩසටහන් නරඹන්නන්ට පරිසර සුරැකීමේ ව්‍යපාරයට එක්වී තම නිවෙස්වල විදුලි උපකරණ අවශ්‍ය නැති අවස්ථාවල නිවා දමා මුදල් ඉතිරි කර ගන්නැයි ඉල්ලා සිටීමේ ව්‍යාපාරයක් අරඹා ඇත.

පරිසරය සුරැකීමේ කටයුතු අතින් මර්ඩොක් වෙනත් මාධ්‍ය ආයතන හිමියන්ට වඩා ඉදිරියෙන් සිටියි. තමා සතු මාධ්‍යය මඟින් තම ගතානුගතික අදහස් පාඨකයා හෝ නරඹන්නාට ඒත්තු ගැන්වීමට මුලින් උත්සාහ කර ඇති ඔහු පරිසරය සුරැකීමේ වැඩ පිළිවෙළට සහයෝගය දැක්වීම සුවිශේෂ සිද්ධියක් ලෙස විචාරකයෝ දකිති. ඩිස්නා සහ ටයිම් වෝනර් වැනි මාධ්‍යයට සම්බන්ධ සමාගම් පරිසර සුරැකීමේ වැඩසටහන් අරඹා ඇතත් ඒවා ඒ සඳහා මර්ඩොක්ගේ සමාගම් තරම් වැඩි මුදලක් වෙන් කර නොමැත.

තම සමාගම් 2010 දී කාබන් පාවිච්චිය අවම කරන බව පවසන මර්ඩොක් තම පුවත්පත්වල ප්‍රවෘත්ති සහ ලිපිවලටත් රූපවාහිනී වැඩ සටහන්වලට සහ චිත්‍රපටවලටත් පරිසරය සුරැකීමේ පණිවුඩය බද්ධ කරන බව කියයි. කාලගුණික වෙනස්වීම බරපතල තර්ජනයකැයි සඳහන් කරන ඔහු එම බරපතලකම කොතෙක්දැයි යන්න ගැන අපට එකඟත්වයකට එළැඹිය නොහැකි වුවත් එම වෙනස්වීම් ගැන අපට කිසිවක් නොකර සිටිය නොහැකි යැයි කියයි.

මර්ඩොක්ගේ පුවත්පත්වල සහ රූපවාහිනී වැඩ සටහන්වලට පරිසරය පිළිබඳ පණිවුඩය බලයෙන් ඇතුළත් නොවෙයි. ආයතනයේ බල ශක්ති නිෂ්පාදන අවශ්‍යතා සහ වාහන සඳහා ජෛව ඩීසල් බලය යොදා ගැනීමටත්, හරිතාගාර වායු නිපදවන යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ඉවත් කර පරිසර හිතකාමී යන්ත්‍ර සහ උපකරණ පාවිච්චියටත් දැනටමත් පියවර ගෙන ඇත.

බිස්කයිබ් රූපාවාහිනී සේවයේ ප්‍රධාන විධායක නිලධාරියා වන මර්ඩොක්ගේ පුත් ජේම්ස් තම මාධ්‍ය ව්‍යාපාරය තුල පරිසර හිතකාමී වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට පුළුල් දායකත්වයක් සැපයීය. ඔහු 2006 සිටම තම ආයතනය තුළ කාබන් පාවිච්චිය අවම කිරීමට කටයුතු කර ඇත. ජේම්ස්ගේ පෞද්ගලික මෝටර් රිය පවා කාබන් මොනොක්සයිඩ් වායුව පිටකිරීම අවම එකකි. ජේම්ස් කටයුතු කරන ආකාරය බිස්කයිබ් රූපාවාහිනී වැඩසටහන් නරඹන්නන් අතර ලොකු බලපෑමක් කිරීමට සමත්වී ඇතැයි නිවුස් කෝපරේෂන්හි පරිසර අංශයේ ප්‍රධානී රෝයි බහත් පවසයි.

මර්ඩොක් තම පරිසරය සුරැකීමේ වැඩ පිළිවෙළ ප්‍රචාරය කිරීම පිණිස ලොව ඉහළම පෙළේ පරිසර හිතකාමීන්ගේ සමුළුවක් කැලිෆෝනියා ප්‍රාන්තයේ දී පසුගිය වසරේ පැවැත්විය. බ්‍රිතාන්‍යයේ එකල අගමැති ටෝනි බ්ලෙයාර් ඇමරිකාවේ හිටපු උප ජනාධිපතිවරයකු වූ අල් ගෝර් කැලිෆෝනියාවේ ආණ්ඩුකාර ආර්නෝල්ඩ් ස්වාසනේගර් මූලධන ව්‍යාපාරික විනෝද් කෝෂ්ලා, බල ශක්ති උපදේශක ඇමරිලොවින්ස් සහ සූර්ය බල ශක්ති ප්‍රචාරක ඉල් ග්‍රොස්ද එම සමුළුවට සහභාගි වූහ.

නිවුස් කෝපරේෂන් ආයතනය ලොව පුරා වසරකදී කාබන් ටොන් 6,41,000 පරිසරයට මුදා හරින බව සොයා ගෙන ඇති අතර 2012 දී එය සියයට 10 කින් කපා හැරීමට සැලැසුම් කර තිබේ. එම සැලසුම් අතර කාබන් අඩුවෙන් මුදා හරින උපකරණ ඇසුරුම් සහ වාහන පාවිච්චියද වෙයි.

වෙනත් පෙදෙස්වල පිහිටුවන ව්‍යාපෘති මඟින් කාබන් පිට කිරීම තවත් විශාල ප්‍රමාණයක් අඩු කිරීමට පියවර ගෙන ඇත. ඒ අනුව නිවුස් කෝපරේෂන් ආයතනය තම මුදල් යොදවා ඉන්දියාවේ මහරාෂ්ට්‍ර ප්‍රාන්තයේ සුළං බල ව්‍යාපෘතියක් පිහිටුවා තිබේ.

මර්ඩොක්ගේ මාධ්‍ය ව්‍යාපාරය ඇමරිකාව බ්‍රිතාන්‍යය හෝ ඕස්ට්‍රේලියාවට පමණක් සීමාවී නැත. එය පරිසරයට අහිතකර හරිතාගාර වායු වැඩි වශයෙන් මුදා හරින ඉන්දියාව සහ චීනය යන රටවලද ව්‍යප්තවී ඇත. එම රටවලද පරිසර හිතකාමී පරිසරයක් ඇති කිරීම කෙරෙහි ප්‍රබල බලපෑම් කිරීමට මර්ඩොක් සමත්ය. ❐

මර්ඩොක්ගේ පුවත්පත්වල සහ රූපවාහිනී වැඩ සටහන්වලට පරිසරය පිළිබඳ පණිවුඩය බලයෙන් ඇතුළත් නොවෙයි. ආයතනයේ බල ශක්ති නිෂ්පාදන අවශ්‍යතා සහ වාහන සඳහා ජෛව ඩීසල් බලය යොදා ගැනීමටත්, හරිතාගාර වායු නිපදවන යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ඉවත් කර පරිසර හිතකාමී යන්ත්‍ර සහ උපකරණ පාවිච්චියටත් දැනටමත් පියවර ගෙන ඇත.

